## ශ්‍රී ලංකා
## ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
## පාර්ලිමේන්තුව

---

# 1990 අංක 24 දරන
# පළාත් පාලන ආයතන
# (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 1990 ජූනි මස 29 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1990 ජූනි මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1990 අංක 24 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1990 ජූනි මස 29 වන දින]

එල්. ඩී.—ඕ. 15/89

**මහජන සාමයට අදාළ කාරණා හේතුකොට ගෙන ඡන්ද විමසීම් පැවැත්වීම කල් දමනු ලැබූ ඇතැම් මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා සඳහා නාම යෝජනා කැඳවීම සහ ඡන්ද විමසීම් පැවැත්වීම සහ ඊට සම්බන්ධ වූ ද ආනුෂංගික වූ ද කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

දිවයිනේ සියලුම මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා සඳහා ඡන්ද විමසීම් සම්බන්ධයෙන් නාමයෝජනා භාරගනු ලබන බවට දැන්වීම් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 26 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ කොට ඇති හෙයින් ද: පූර්විකාව.

මහ නගර සභා දෙකක් ද, නගර සභා හතරක් ද, ප්‍රාදේශීය සභා තිස් හයක් ද වෙනුවෙන් නාම යෝජනා ලැබී නොතිබුණු හෙයින් ද:

මහ නගර සභා අටක්, නගර සභා තිහක් සහ ප්‍රාදේශීය සභා එක සිය පනස් තුනක් සම්බන්ධයෙන් ඡන්ද විමසීම් පවත්වනු ලැබ සහ එකී මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා සඳහා ඡන්ද විමසීමේ දිනය පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 38 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීම් මගින් 1987 අගෝස්තු 15 හැටියට නියම කර තිබුණු හෙයින් ද:

යට කී මහ නගර සභා අට, නගර සභා තිහ සහ ප්‍රාදේශීය සභා එකසිය පනස් තුන වෙනුවෙන් වූ ඡන්ද විමසීම් සඳහා නියම කරන ලද දිනය මහජන සාමයට අදාළ කාරණා හේතුකොට ගෙන මහජන ආරක්ෂක ආඥාපනත යටතේ සාදනා ලද නියෝග මගින් කල් දමනු ලැබූ හෙයින් ද:

යට කී මහ නගර සභා අට, නගර සභා තිහ සහ ප්‍රාදේශීය සභා එකසිය පනස් තුන සම්බන්ධයෙන් නාම යෝජනා භාර ගැනීමෙන් පසු ඉකුත් වී ඇති කාලය හේතුකොට ගෙන එකී මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා සම්බන්ධයෙන් අලුතින් නාම යෝජනා කැඳවීම සඳහා විධිවිධාන සැලැස්වීමට ද, එකී මහ නගර සභා අට, නගර සභා තිහ සහ ප්‍රාදේශීය සභා එකසිය පනස් තුන සම්බන්ධයෙන් සහ (මෙහි පූර්විකාවේ 2 වන ඡේදයේ සඳහන්) නාම යෝජනා නොලැබුණු මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා සම්බන්ධයෙන් අළුතෙන් ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා විධිවිධාන සැලැස්වීමට ද අවශ්‍යව ඇති හෙයින්,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1990 අංක 24 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

ඇතැම් මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති නාමයෝජනා සහ තබා ඇති ඇප සම්බන්ධයෙන් විධිවිධාන.

2. (1) ආඥාපනතේ 26 වන වගන්තිය යටතේ පළ කරන ලද දැන්වීම් ප්‍රකාර 1988 අංක 38 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ II, III සහ IV වන උපලේඛනවල නිශ්චිතව සඳහන් මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා සඳහා ඡන්ද විමසීම් සම්බන්ධයෙන් ආඥාපනතේ 28 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද නාමයෝජනා පත්‍ර කිසි විටෙකත් ඉදිරිපත් කරනු නොලැබුවාක් මෙන් ද වලංගු නොවන හා බලාත්මක නොවන ලෙසද මෙයින් සලකනු ලැබේ.

(2) 1988 අංක 38 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ II, III සහ IV වන උපලේඛනවල නිශ්චිතව සඳහන් මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා සඳහා ඡන්ද විමසීම් සම්බන්ධයෙන් ආඥාපනතේ 38 වන වගන්තිය යටතේ පළ කරන ලද දැන්වීම් මෙයින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබේ.

(3) 1988 අංක 38 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ II, III සහ IV වන උපලේඛනවල නිශ්චිතව සඳහන් යම් මහ නගර සභාවකට, නගර සභාවකට හෝ ප්‍රාදේශීය සභාවකට තෝරා පත් කර ගැනීම සඳහා ස්වාධීන කණ්ඩායමක් විසින් නම් කරනු ලැබූ අපේක්ෂකයන් සම්බන්ධයෙන් ආඥාපනතේ 29 වන වගන්තිය යටතේ කර ඇති තැන්පත් ආඥාපනතේ 30 වන වගන්තියේ පටහැනිව කුමක් සඳහන් වුවද එය නොතකා, ආඥාපනතේ 30 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ තමන් වෙත නිකුත් කරනු ලැබූ ලදුපතක් එවැනි තැන්පතුවක් තැබූ තැනැත්තා විසින් ඉදිරිපත් කරනු ලැබූ විට, ඒ තැන්පතුව කළ දින සිට මුදල් ආපසු ගෙවනු ලබන දිනය දක්වා වූ කාල යට වර්ෂයකට සියයට 12 බැගින් වූ පොලියක් සමග ඒ තැන්පත් මුදල ඒ තැනැත්තා වෙත ආපසු ගෙවනු ලැබිය යුතු ය.

ඇතැම් මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා සඳහා ඡන්ද විමසීම් පැවැත්වීම සම්බන්ධයෙන් ගත යුතු පියවර.

3. (අ) 1988 අංක 38 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ II සහ III වන උපලේඛනවල නිශ්චිතව සඳහන් වූ ද සභිකයන්ගේ ධුර කාලය 1991 ජනවාරි 1 වන දින දී හෝ ලිඛිත නීතිය යටතේ නියමිත ඊට කලින් වූ යම් දිනයක හෝ අවසන් වන්නේ වූ ද මහ නගර සභා සහ නගර සභා සඳහා ඡන්ද විමසීම් පැවැත්වීමට ආඥාපනත යටතේ පියවර ගැනීම ආරම්භ කරනු ලැබිය යුතු ය.

(ආ) 1988 අංක 38 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ IV වන උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් වූ ද සභිකයන්ගේ ධුර කාලය 1991 ජනවාරි 1 වන දින දී හෝ ලිඛිත නීතිය යටතේ නියම කරනු ලබන ඊට කලින් වූ යම් දිනක දී ආරම්භ වන්නා වූ ද ප්‍රාදේශීය සභා සඳහා ඡන්ද විමසීම් පැවැත්වීමට ආඥාපනත යටතේ පියවර ගැනීම ආරම්භ කරනු ලැබිය යුතු ය.

(ඇ) 1988 අංක 38 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතේ V වන උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා සඳහා ඡන්ද විමසීම් පැවැත්වීමට ආඥාපනත යටතේ පියවර ගැනීම ආරම්භ කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

**4.** මේ පනතේ 2 වන සහ 3 වන වගන්තිවල සඳහන් " ආඥා පනත " යන්නෙන් (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත අදහස් වේ.

1987 අංක 20 දරන පනත යටතේ කරනු ලැබූ ක්‍රියා වලංගු බවට පත් කිරීම.

**5.** (1) පහත සඳහන් පරිදි, එනම්,—

(අ) 1987 අංක 20 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත මගින් සංශෝධිත පරිදි වූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත ප්‍රකාර හෝ එය ප්‍රකාර යයි සලකනු ලබන ; සහ

(ආ) 1987 අප්‍රේල් මස 16 වන දිනෙන් පසුව සහ 1987 අංක 20 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතේ 1 වන වගන්තිය යටතේ කරනු ලැබූ නියමයක් මගින් නියම කරනු ලැබූ දිනයට පෙර (මෙහි මින් මතු " අදාළ කාල පරිච්ඡේදය " යනුවෙන් සඳහන් කරනු ලබන) කාල පරිච්ඡේදය තුළ දී

මහ නගර සභාවක් නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් සඳහා පවත්වන ලද සෑම ඡන්ද විමසීමක්ම හෝ කරනු ලැබූ සෑම ප්‍රකාශයක්ම හෝ කරනු ලැබූ සෑම ක්‍රියාවක්, ඒ ඡන්ද විමසීම් පැවැත් වූ දිනයේදී, ඒ ප්‍රකාශනය කරනු ලැබූ දිනයේදී හෝ ඒ ක්‍රියාව කරනු ලැබූ දිනයේදී 1987 අංක 20 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත ක්‍රියාත්මකව පැවතියාක් මෙන් සියලු කාර්යය සඳහා වලංගු සහ බල සහිතව පැවැති බව සහ පවතින බව සලකනු ලැබිය යුතු ය.

(2) 1987 අංක 20 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත මගින් සංශෝධිත පරිදි වූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධාන ප්‍රකාර හෝ ඒ විධිවිධාන ප්‍රකාර යයි සලකනු ලබන යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් අදාළ කාල පරිච්ඡේදය තුළ දී සද්භාවයෙන් කරනු ලැබූ රජයේ නිලධරයකුට විරුද්ධව අපරාධ හෝ සිවිල් නඩු කටයුත්තක් පැවරීම හෝ පවත්වාගෙන යාම හෝ නොකළ යුතු ය.

අනනුකූල තාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

**6.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූල තාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් වල සහ පනත් වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.